
මහාචාර්ය මාලනී ඇඳගම උපහාර කලාපය



# විදාරණී

## 2017

### ශාස්ත්‍රීය සංග්‍රහය

**2 වෙළුම - 1 කලාපය**

## පටුන


1. **අතීතය යළි සිහිපත් කරවන නුගේගොඩ ජුබිලි කණුව සෙල්ලිපිය** **1**
ගයාන් බඳුරලිය

2. **අනුරාධපුර ජේතවන විහාරයේ ඉතිහාසය පිළිබඳ කරුණු කිහිපයක්** **13**
මහාචාර්ය ටී.ජී කුලතුංග

3. **Belief in ghosts and ancestors among the Chinese** **27**
Anedo Alexander Alfred Onukwube and
Anedo Edith Ngozi

4. **චීනයේ ශාන් රාජ වංශයේ සොහොන්වලින් හෙළිවන බිලිපූජා** **52**
ආචාර්ය ගාමිණී රණසිංහ
කථිකාචාර්ය ඉනෝජ් කෞශල්‍යා අබේනායක

5. **පුරාවිද්‍යා ගවේෂණ** **59**
ජී.ඩබ්. චාමලී අනූෂිකා කුමාරි

6. **රජගලතැන්න ආරාමික භූමියෙහි ජල ගබඩාකරණය හා පරිහරණ විධික්‍රම** **76**
බී.වී. සුජීවා කෝෂලී ප්‍රේමරත්න

7. **ලංකාව හා වෙනත් රටවල් අතර පැවති සම්බන්ධතා අධ්‍යයනය කිරීමට යොදාගත හැකි මූලාශ්‍රය (ක්‍රි.ව 13-15 සියවස් අතර)** **87**
කථිකාචාර්ය උදය නෙලුම් රත්නායක

# ලංකාව වෙනත් රටවල් සමඟ පැවැත්වූ සබඳතා අධ්‍යයනය කිරීමට යොදාගත හැකි සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක්

**(ක්‍රි.ව 13-15 වැනි සියවස් අතර)**

උදය නෙලුම් රත්නායක

## හැඳින්වීම

ක්‍රි.ව. 13-15 වැනි සියවස් අතර කාලවකවානුවේ ලංකාව වෙනත් රටවල් සමඟ සම්බන්ධතා පැවැත්වූ ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා යොදාගත හැකි මූලාශ්‍රය බොහෝ වෙති. ඒවා සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස දේශීය හා විදේශීය වශයෙන් පැවතීම මෙකී අධ්‍යයනය පහසු කරවන්නකි. මෙම ලිපිය තුළින් එකී මූලාශ්‍රය අතරින් දේශීය සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක් පිළිබඳ විමර්ශනය කිරීම අපේක්ෂා කෙරේ.

## සාහිත්‍ය මූලාශ්‍රය

ක්‍රි.ව 13-15 වැනි සියවස් අතර කාලපරිච්ඡේදයේ ලංකාවේ විදේශ සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වැදගත් තොරතුරු සපයන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙසින් මහාවංශය හඳුන්වාදිය හැකිය. ක්‍රි.ව 5 වැනි සියවසේ පමණ මහාවංශයේ මුල් කොටස රචනා කිරීමෙන් පසුව වරින්වර කතුවරු කිහිප දෙනෙකු විසින් රචනා කරන ලද අඛණ්ඩ දිගුවක් ලෙසින් මෙම ග්‍රන්ථය පවත්වාගෙන ගොස් ඇත. මෙම කොටස්වල කර්තෘවරු

පිළිබඳ නොයෙකුත් මතවාද ඉදිරිපත් වී තිබේ. ආචාර්ය සිරිමා වික්‍රමසිංහ විසින් ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය කෘතිය සඳහා මහා පරාක්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තික පාලකවරුන් ගේ සමයේ සිට කාලිංග මාඝගේ ආක්‍රමණය දක්වා කාලවකවානුව පිළිබඳ පරිච්ඡේදයක් ලියන ලදී. (වික්‍රමසිංහ 1972:482-500) එහි මහාවංශයේ ද්විතීය භාගය එනම් 37 වන පරිච්ඡේදයේ සිට 79 වැනි පරිච්ඡේදය දක්වා කොටස එක් කතුවරයෙකු විසින් රචනා කරන ලදැයි යන මෙතෙක් පැවති විශ්වාසය අභියෝග යට ලක්කර ඇත. මීට පෙර ගෛගර් පඬිතුමා ගේ චූලවංස සංස්කරණය තුළ මෙසේ එක් කතුවරයෙකු පමණක් එම කොටස රචනා කිරීමට දායක වූ බව පිළිගෙන තිබිණි. (*Mahavamsa* 1958: I-LV) නමුත් වික්‍රමසිංහ පෙන්වාදෙන පරිදි මෙම කොටසෙහි මහා පරාක්‍රමබාහු රජු පිළිබඳ ලියැවී ඇති ප්‍රශස්ති කාව්‍යමය වර්ණනාව ඉන් පෙර පාලන බලය මෙහෙයවූ රජවරුන් පිළිබඳ රචනාවී ඇති ආකාරයත් අතර පැහැදිලි වෙනස්කමක් දක්නට ලැබේ.

ප්‍රස්තුත මාතෘකාවට අදාළ මහාවංශය කොටස වනුයේ කාලිංග මාඝ රජරට යටත්කර ගැනීමේ තොරතුරු දැක්වෙන 80 වැනි පරිච්ඡේදයේ සිට ඉදිරියට කොටස් ය. මෙහි දී මෙම කොටසේ ආරම්භය වන 79 වැනි පරිච්ඡේදයේ 84 වැනි ගාථාවේ දී 'නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස' යන නමස්කාර පාඨය යොදා ඇත. (මහාවංශය 1966:79,84) එබැවින් එම කොටස අලුතින් ආරම්භ වූ එකක් බව පිළිගැනීමට එය ප්‍රමාණවත් සාක්ෂියකි. විශේෂයෙන් මීන් පෙර පරිච්ඡේදය තුළ මහා පරාක්‍රමබාහු රජුගේ හිංසාකාරී ක්‍රියාකලාපය හේතුවෙන් ජනතාව ඉතා පීඩාකාරී තත්ත්වයට පත්ව සිටි බව වංශකතාකරු පිළිගෙන ඇති බැවින් එය තවත් එක් කාල පරිච්ඡේදයක අවසානය ලෙස පැහැදිලි ලෙස සැලකිය හැකිය. 80 වැනි පරිච්ඡේදය සිට නව කතුවරයෙකු රචනා කිරීම ආරම්භ කරන ලදැයි යන්න නිසැකව පිළිගත හැකිය. 80 වැනි පරිච්ඡේදයේ සිට 90 වැනි පරිච්ඡේදය දක්වා වූ දෙවැනි විජයබාහු රජුගේ කාලයේ සිට

කුරුණෑගල හතරවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය දක්වා වූ මෙම කොටස චූලවංශයේ ද්විතීය භාගය ලෙසින් පිළිගෙන ඇත. (ලියනගමගේ 1989:9) චූලවංසයේ තෙවැනි භාගය 90 වැනි පරිච්ඡේදයේ 103 වැනි ගාථාවෙන් ආරම්භ වී මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජු දක්වා තොරතුරු ඉදිරිපත් කර තිබේ.

මහාවංශයේ ද්විතීය භාගය රචිත කාලය (චූලවංශය ප්‍රථම භාගය) හා කර්තෘවරයා පිළිබඳව ද තොරතුරු අප්‍රකට ය. මේ සඳහා උපකාරී වන කිසිදු වැදගත් සාක්ෂියක් මහාවංශයේ ද්විතීය භාගයෙන් හෝ සොයා ගැනීම අපහසු ය. මෙම කාලපරිච්ඡේදය එනම් ක්‍රි.ව 13 වැනි සියවස සිට ඉදිරියට ඒ ඒ යුගවල රචනා කරන ලද වෙනත් සාහිත්‍ය කෘතීන්හි ඒ ඒ කෘති අදාළ කතුවරයා පිළිබඳ පමණක් නොව ඔවුන්ගේ ජාති, පරම්පරා පිළිබඳව ද වතගොත ඉදිරිපත් කර තිබෙනු දක්නට ලැබේ. (පූජාවලිය 2010:256, සද්ධර්මරත්නාවලිය 1955:04) එහෙත් මහාවංශයේ මෙම කොටස රචනා කිරීමේ දී මීට පෙර කොටස්වල කතුවරුන් මෙන් කර්තෘවරයා අඥාතව පෙනී සිටීමේ සම්ප්‍රදාය අනුගමනය කර ඇත.

මහා පරාක්‍රමබාහු රජුගේ ඇවෑමෙන් පසුව රජ පැමිණි දෙවැනි විජයබාහු රජුගේ රාජ්‍ය කාලයේ සිට කුරුණෑගල සිව්වැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලසීමාව දක්වා සියවස් දෙකකට අධික කාලයක් පිළිබඳ මහාවංශයේ තෘතිය භාගය හෙවත් චූලවංශයේ දෙවන කොටසින් තොරතුරු ආවරණය වේ. එසේම මෙම කොටස සිව්වැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය අවසන් වීමෙන් වැඩි කලක් ගතවීමට පෙර රචනා කරන ලදැයි අමරදාස ලියනගමගේ විශ්වාස කරයි. (ලියනගමගේ 1989:11) මෙහි කතුවරයා කවරෙක් ද යන්නත් අවිනිශ්චිත ය. (පරණවිතාන 1972: 51-52)

මෙම කාලවකවානුව ලංකා ඉතිහාසයේ සාහිත්‍ය කටයුතු අතින් ඉතා දියුණු මට්ටමක පැවති බවට සාධක තිබේ. (Godakumbura 1955:105-127) දසවැනි සියවසේ දී රචනා වූ

පාලි බෝධිවංශය පදනම් කරගනිමින් හතරවැනි පරාක්‍රමබාහු රජුගේ ආරාධනාව මත විල්ගම්මුල ශ්‍රී පරාක්‍රමබාහු මහාසාමි විසින් සිංහල බෝධිවංසය රචනා කරන ලදී. (සිංහල බෝධිවංසය 1911:118-121) එම රජුගේ කාලයට හෙවත් ශක වර්ෂ 1247 (එනම් ක්‍රි.ව 1325) දී රචනා වූ දන්ත ධාතුවේ ඉතිහාසය, එහි වත් පිළිවෙත් හා සම්ප්‍රදායන් පිළිබඳ අනුගත දළදා සිරිත නම් වූ වැදගත් සාහිත්‍ය කෘතිය ද තවත් නිදසුනකි. (දළදා සිරිත 1946:04) මහාවංශයේ තෘතිය භාගයේ දැක්වෙන පරිදි මේ කෘතිය එකී කර්තෘ ගේ රචනයකි. (මහාවංශය 1966:90,77-79) තව ද මෙතුමා සිංහල ජාතක කතා රචනා කිරීම කෙරෙහි හා ඒවා ජනතාව අතර ප්‍රචාරණය කිරීමේ වැදගත්කම අවබෝධ කරගනිමින් කටයුතු කළ ආකාරය මහාවංසයේ විස්තර කර තිබේ. (මහාවංශය 1966:90,80-86) ඒ අනුව දළදාව, ථූපය, බෝධිය වැනි පූජනීය වස්තූන් හා පූජනීය ස්ථාන මුල්කර ගනිමින් සාහිත්‍ය කෘති රචනාවීමේ සම්ප්‍රදායක් එවකට පැවති බව ප්‍රත්‍යක්ෂ වේ. මෙබඳු ශාස්ත්‍රීය උද්‍යෝගයක් පැවති අවධියක දිවයිනේ ඉතිහාසය නැවත වරක් ලියා තැබීමට උනන්දු වනුයේ නිතැතිණි. එතෙක් ලියා තිබූ පාලි මහාවංසයේ දෙවන කොටස අවසාන කළ කාලවකවානුවේ සිට ඉදිරියට තවත් කොටසක් රචනා කිරීමට යම් ප්‍රයත්නයක් දරා ඇත. (ලියනගමගේ 1989:11)

කුරුණෑගල සිව්වැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය පිළිබඳ විස්තරය ගාථා හතළිස් එකකින් (41) පමණ සංගෘහිත ය. (මහාවංශය 1966:90,64-105) මෙය මහාවංශයේ තෘතිය භාගයේ විස්තර වන අනෙකුත් රජවරුන්ට සාපේක්ෂව දීර්ඝ වර්ණනා සහිත අවස්ථාවකි. ඒ අනුව මෙම කොටස රචනා වූයේ මෙම රජුගේ කාලයේ දී යැයි බොහෝ දුරට විශ්වාස කළ හැකි නමුත් එය සෘජුව පැවසීම අපහසුය. ඇතැම් විට සිව්වැනි පරාක්‍රමබාහු රජු විසින් බුදු සසුනට හා සිංහල සාහිත්‍ය උදෙසා සිදුකළ ඉමහත් සේවාව පිළිබඳ දීර්ඝ කාලයක් ජනතාව අතර මතකයේ පවතින්නට ඇත. එබඳු පසුබිමක මෙම පාලකයා පිළිබඳ පසුකාලීන රචකයින් විසින් වර්ණනා කිරීමට පෙළඹීම

සාධාරණ ය. එනිසා මහාවංශයේ තෘතිය භාගය කුරුණෑගල සිව්වැනි පරාක්‍රමබාහු රජුට සමකාලීන යැයි එකවර පැවසීම යෝග්‍ය නොවේ.

මහාවංශයේ තෘතිය භාගයේ සිට ඉදිරිපත් වන තොරතුරුවල ප්‍රමාණාත්මක භාවය පිළිබඳව ද සඳහන් කළ යුතුය. පොළොන්නරු රාජධානිය කාලිංග මාඝගේ ආක්‍රමණය නිසා ක්‍රමයෙන් පරිහානියට පත්වීමෙන් අනතුරුව පැවති දේශපාලන ව්‍යාකූලතාව පිළිබඳ මහාවංශයේ ද්විතීය භාගයේ විස්තර කර තිබේ. ඒ අනුව මායා රට ප්‍රධාන කොට රුහුණේ ප්‍රාදේශීය පාලකයින් කිහිපදෙනෙකු විසින් ගෙන යන ලද ස්වාධීන පාලනය පිළිබඳ ලුහුඬු විස්තරයක් ඇතුළත්ව ඇත. එහි දී මායා රටේ සිටි ස්වාධීන පාලකයෙකු ලෙස දඹදෙණියේ තුන්වැනි විජයබාහු රජු පිළිබඳ පරිච්ඡේදයක් වෙන්කර තිබේ. (මහාවංශය 1966:81, 01-80) වන්නි ප්‍රධානියෙකු ලෙස විජයබාහු ක්‍රමයෙන් නැඟී සිටීමත් පසුව මායා රටේ ආධිපත්‍ය හිමිකර ගැනීමත් ඔහුගේ කාර්ය සාඵල්‍ය තුළ ශාසනික මෙහෙවර ඇගයීමත් මෙම කොටසේ දී විස්තර කර තිබේ. මෙම ප්‍රාදේශීය පාලකයන් පිළිබඳ ඉදිරිපත් කරන ලද තොරතුරු මෙකල ඉතිහාසය හදාරණ අයෙකුට අධ්‍යයනය කළ හැක්කේ මහාවංසයේ මෙම ද්විතීය භාගයෙන් පමණි. එනම් වෙනත් මූලාශ්‍රයවල සමකාලීන අවධිය පිළිබඳ තොරතුරු ගෙනහැර දැක්වීමේ දී මෙම ප්‍රාදේශීය පාලකයින් පිළිබඳ සඳහනක් කර නොමැත.

දඹදෙණියේ ශ්‍රේෂ්ඨතම පාලකයා වන දෙවැනි පරාක්‍රමබාහු රජු පිළිබඳ වෙන්වූ පරිච්ඡේද අටක (08) ප්‍රමාණයෙන් බහුතරයක් වෙන්වී ඇත්තේ එතුමා ගේ ශාසනික සේවාව අගයනු පිණිස ය. (මහාවංශය 1966:81-89) එනමුත් එතුමා කාලිංග මාඝ පලවා හැරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපිළිවෙත විස්තර කර නොමැත. (මහාවංශය 1966:83, 11-35) මේ රාජ්‍ය සමයේ එල්ල වූ චන්ද්‍රභානු ගේ ආක්‍රමණය පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු මෙහි දක්වා ඇති නමුත් එය ද යම් යම් අඩු ලුහුඬුතාවලින් යුක්ත වේ. (මහාවංශය 1966:83, 36-51) මෙම තොරතුරු මහා

පරාක්‍රමබාහු රජුගේ දේශීය හා විදේශීය සිවිල් යුධ ව්‍යාපාර පිළිබඳ මහාවංශයේ ද්විතීය භාගයේ දැක්වෙන විස්තර සමඟ සන්සන්දනය කිරීමෙන් එම තොරතුරුවල ප්‍රමාණාත්මක වෙනස අවබෝධ කරගත හැකිය. (මහාවංශය 1966:76-77) එසේ ම දෙවැනි පරාක්‍රමබාහු රජු විදේශ රාජ්‍ය සමඟ පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ ඉදිරිපත් කරන තොරතුරු පවා අවිනිශ්චිත භාවයකින් හා සීමිත භාවයකින් ඉදිරිපත් කරන බව එම තොරතුරු විග්‍රහකර බැලීමෙන් තහවුරු වේ. නිදසුනක් ලෙස මේ රාජ්‍ය කාලයේ සිදුවූ පාණ්ඩ්‍ය ආක්‍රමණය පිළිබඳ දකුණු ඉන්දියානු සමකාලීන මූලාශ්‍රය ඇසුරින් හෙළිකරගත හැකි තොරතුරු කිසිවක් මහාවංශයට ඇතුළත්ව නැත. මෙබඳු ඌණතා කිහිපයක් ඇති නමුත් දඹදෙණියේ දෙවැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය සමය අළලා වඩාත් දීර්ඝ විස්තරයක් මහාවංසය තුළ ඉදිරිපත් වන බැවින් පවත්නා දුර්වලතා යම් පමණකට හෝ මඟහරවා ගත හැකිය. පොළොන්නරුවේ අසහාය පාලකයින් ලෙස ගැණෙන මහා විජයබාහු හා මහා පරාක්‍රමබාහු රජවරුන් ගේ රාජ්‍ය අවධීන් පිළිබඳ දැක්වෙන ප්‍රමාණාත්මක තොරතුරු, දඹදෙණියේ රජවරු පිළිබඳ ඉදිරිපත්ව නොතිබීම මෙම කාලවකවානුව පිළිබඳ හදාරණ අයෙකුට ඇති ප්‍රධාන අභියෝගයකි.

මහාවංශයේ මෙම කාල පරිච්ඡේදය පිළිබඳ තොරතුරු සෑහෙන ප්‍රමාණයක් අනාවරණය නොවීම සඳහා බලපෑ සාධක විමසා බැලිය යුතුය. එහිදි හඳුනාගත හැකි ප්‍රධාන සාධකයක් නම් මහාවංශය සඳහන් කරන ආකාරයට ම රජරට ආක්‍රමණය කළ කාලිංග මාඝ විසින් එතෙක් රචනා වූ සාහිත්‍ය කෘති හා ආගමික කෘති විශාල ප්‍රමාණයක් ඉතා අකාරුණික අන්දමින් විනාශ කිරීම බව සඳහන් වේ. (මහාවංශය 1966:80, 67) ඒ අනුව පසුකාලීන සාහිත්‍ය කෘති රචකයින්ට මූලාශ්‍රය කරගත හැකි කෘතීන් අවම වූ බව සිතීමට තරම් සාධක වේ. නිකාය සංග්‍රහයේ සඳහන් වන පරිදි මාඝගේ දරුණු ක්‍රියා කලාපය නිසා භික්ෂූන් වහන්සේලා රජරට අතහැර ආරක්ෂාව පතා මායා රටට සංක්‍රමණය වූහ. (නිකාය සංග්‍රහ හෙවත් ශාසනාවතාරය 1989: 19)

මේ අනුව පැහැදිලි වනුයේ පොළොන්නරුව රාජධානිය අග භාගයේ සිට පැවති වියවුල්කාරී වාතාවරණය හා මාඝ ගේ සංග්‍රාමය හේතුවෙන් මහාවංශ රචකයින්ට මූලාශ්‍රමය ගැටලුවකට මුහුණ පෑමට සිදුවූ බවය. නමුත් එම අර්බුදකාරී වාතාවරණය තුළ දී පවා මෙම කාලවකවානුව සම්බන්ධයෙන් මහාවංශයේ ද්විතීය භාගය තුළින් ඉතිහාසය අධ්‍යයනය කරන පර්යේෂකයෙකුට ලැබෙන පිටුබලය අතිමහත් ය. ක්‍රි.ව 13-15 වැනි සියවස් අතර නිරිතදිග ප්‍රදේශයේ පාලන මධ්‍යස්ථාන ක්‍රියාත්මක වූ අවධියේ මෙරට විදේශ සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය කිරීමට අපේක්ෂාවෙන් සිටින ඕනෑම පර්යේෂකයෙකුට ඒ සඳහා අවස්ථාව උදාකර ගැනීමට තරම් ප්‍රමාණවත් මූලාශ්‍රය බොහෝ වෙති. එනම් මේ යුගයේ ඉතිහාසය අධ්‍යයනය කරන විද්‍යාර්ථයෙකුට ඇති ප්‍රධානතම වාසි සහගත තත්ත්වය නම් මහාවංශයේ ද්විතීය හෝ තෘතීය භාගයන් හැරුණු කොට මෙරට ඉතිහාසය හැදෑරීමට උපකාරීවන සමකාලීන සාහිත්‍ය කෘති කිහිපයක්ම සොයාගැනීමට හැකිවන බැවිනි.

ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස මහාවංශය හිමි කරගත් වැදගත්කමට සමානත්වයක් මේ යුගයේ දී රචනා වූ පූජාවලියට හිමි වේ. බුදුන් වහන්සේ ගේ 'අරහං' යන බුදු ගුණය වර්ණනා කිරීමේ අරමුණ ඇතිව රචනා වූ මෙම බෞද්ධ කෘතිය පරිච්ඡේද තිස් හතරකින් (34) සමන්විත විශාල ග්‍රන්ථයකි. මෙහි අවසාන පරිච්ඡේද දෙක (02) වන සම්‍යක් ප්‍රතිපත්ති පූජා කථා හා උද්දේසික පූජා යන ඒවායේ ආදිතම කාලයේ සිට දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජ සමය දක්වා ලංකා ඉතිහාසයේ තොරතුරු සංක්ෂිප්තව ගෙනහැර දක්වා ඇත. තිස් හතරවැනි පරිච්ඡේදයේ තුන්වැනි විජයබාහු රජු දඹදෙණියේ පාලකයා බවට පත්වීම හා දෙවැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය පිළිබඳ දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කරන (පූජාවලිය 2010:844-855) මෙම ග්‍රන්ථයේ අවසාන පරිච්ඡේද දෙක ඓතිහාසික වැදගත්කමින් යුක්ත ය. සෙසු පරිච්ඡේද තත් කාලීන සමාජ තොරතුරු අධ්‍යයනය කිරීමට උපකාරී වේ.

පූජාවලියේ කර්තෘත්වය පිළිබඳ ගැටලුවක් නොමැත. තිස් හතරවැනි පරිච්ඡේදය අවසානයේ කියැවෙන අන්දමට මෙම කෘතිය දෙවන පරාක්‍රමබාහු රජ සමයේ විසූ වාතගිරියේ හෙවත් වාකිරිගල මයුරපාද පිරිවෙන නම් එවකට ප්‍රකට අධ්‍යාපන ආයතනයේ වැඩ වාසය කළ මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍රයන් හිමියන් විසින් රචනා කරන ලද බව සඳහන් ය. (පූජාවලිය 2010:864) මෙම අධ්‍යාපන ආයතනය දෙවැනි පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහය මත දියුණුව පැවති බවට මුලාශ්‍රය සාධක වේ. (පූජාවලිය 2010:850-853, මහාවංශය 1966:88, 43-47) නිකාය සංග්‍රහයේ නිකාය සාමාග්‍රී කථා පුවත් දැක්වෙන පරිච්ඡේදයේ අවසාන භාගයේ ආගමික ග්‍රන්ථ හා සාහිත්‍ය ග්‍රන්ථ නිර්මාණකරුවන් පිළිබඳ දැක්වෙන නාම ලේඛනයේ මයුරපාද යන නාමය ද සඳහන් කර ඇත. (නිකාය සංග්‍රහ හෙවත් ශාසනාවතාරය 1989:20)

මෙම ග්‍රන්ථය රචිත කාලය පිළිබඳ පෙළෙහි දක්නට ලැබෙන නමුත් (පූජාවලිය 2010:864) මෙහි දැක්වෙන ඇතැම් පාඨයන් කෙරෙහි අවධානය යොමු කරමින් දඹදෙණි රාජ්‍ය සමය හැදෑරීමට උපකාරී වන අවසාන පරිච්ඡේද දෙක (02) රචනා වූ කාලය පිළිබඳ නැවත වරක් සලකා බැලිය යුතුය. පෙර සඳහන් කළ පරිදි මෙම කෘතිය දෙවන පරාක්‍රමබාහු රජුගේ තිස්වැනි රාජ්‍ය වර්ෂයේ දී (ක්‍රි.ව. 1266) රචනා කළ බව කෘතිය අවසාන පාඨයේ සඳහන් කර ඇත. නමුත් ඇතැම් පිටපත්වල මෙම කරුණ අන්තර්ගත නොවූ බව ආචාර්ය අමරදාස ලියනගමගේ පෙන්වා දී ඇත. (ලියනගමගේ 1989:18) තව ද මෙම ග්‍රන්ථයේ අවසාන පරිච්ඡේදය ආරම්භයේ,.

'අප මහ ගෞතම ප්‍රථම බොධියෙහි පටන් මාගේ මේ ස්තුති පූජාවගේ අවසානයට, එක්දහස් අටසිය සුපණස් හවුරුදෙක් අතික්‍රාන්ත විය. මෙවකට සිංහලාධිපති රජහු එක්සිය තෙලණස් දෙනෙක් වොටුනු පැලඳ රජ කළහ.' යනුවෙන් සඳහන් වී ඇත. මෙම පාඨය සංස්කරණ කිහිපයකම අන්තර්ගතවීම ද තවත් වැදගත් ලක්ෂණයකි. (පූජාවලිය 2010:824)

නමුත් ඇතැම් සංස්කරණවල මෙහි දැක්වෙන ප්‍රථම බෝධියෙහි පටන් අවුරුදු මාගේ මේ ස්තුති පූජාව,.... යන පාඨය නොදැක්වේ. (පූජාවලිය 2010:824) එහි දී අර්ථ ගැන්වී ඇත්තේ ගෞතම බුදුන් ගේ අවසානය දක්වා කාලය පිළිබඳ අදහසකි. එය සාවද්‍ය බව පැහැදිලි ය. විශේෂයෙන් කිසියම් සිදුවීමක කාලය දැක්වීමේ දී බුද්ධ වර්ෂ, සම්බෝධි වර්ෂය හෝ පරිනිර්වාණ වර්ෂය හෝ දැක්වීම සම්ප්‍රදාය වේ. දෙවැනි පරාක්‍රමබාහු රජ සමයේ රචිත හත්ථවනගල්ල විහාරවංසයේ රජු අභිෂේක ලද වර්ෂය ඉදිරිපත් කොට ඇත්තේ පරිනිර්වාණයේ සිට නොව සම්බෝධියට පත් වූ වර්ෂයේ සිට ය. (හත්ථවනගල්ල විහාරවංසය 2008: 01, Hattavanagallaviharavamsa 1956: II, එළු අත්තනගලු වංසය 2008: 01) යාපහුවේ පළමු වන බුවනෙකබාහු රජු විසින් සම්පාදිත යෝගාර්ණවය කෘතිය රචනා කළ වර්ෂය දක්වා ඇත්තේ ද මෙම සම්ප්‍රදායට අනුගතව ය. (යෝගාර්ණවය 2008 :12)

පූජාවලිය රචනා කළ වර්ෂය ද සම්බෝධියට පත්වීමේ වර්ෂයේ සිට ගණන් ගෙන ඇති බව ඉහත තොරතුරු ඇසුරින් තහවුරු වේ. ඒ අනුව පූජාවලිය ක්‍රි.ව 1266 දී රචනා වූ බව ඉතා පැහැදිලි කරුණකි. එහෙත් මෙම මුළු ග්‍රන්ථය ම එම වර්ෂයේ රචනා වූයේ ද නැතිනම් එම වර්ෂ සඳහන සහිත තිස්තුන් වැනි (33) හා තිස් හතරවැනි (34) පරිච්ඡේද පමණක් එම වර්ෂයේ දී රචනා වූයේ ද යන්න නැවත උද්ගත වන ගැටලුවකි. ආචාර්ය අමරදාස ලියනගමගේ (ලියනගමගේ 1989:20) තවදුරටත් පැහැදිලි කර ඇත්තේ මෙම අවසාන පරිච්ඡේද දෙකම එසේ පසුකාලීනව මෙම ග්‍රන්ථය සඳහා එකතු වූ බවක් නොවේ. එනම් අවසාන පරිච්ඡේදය වන තිස් හතරවැනි පරිච්ඡේදයේ දෙවැනි පරාක්‍රමබාහු ගේ රාජ්‍ය කාලයේ අවසාන භාගයේ තොරතුරු ගෙන හැර දැක්වෙන පාඨයන්ට අනුව එම කොටස් පසුව මෙම ග්‍රන්ථයට එක් වූ බව ය. (ලියනගමගේ 1989: 21)

දෙවැනි පරාක්‍රමබාහු රජුගේ අවසාන රාජ්‍ය සමයේ ඔහු විසින් සිදු කරන්නට යෙදුණු ශාසනික මෙහෙවර පිළිබඳ

මෙහි අවසාන පරිච්ඡේදයේ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වේ. එසේම ක්‍රි.ව 1262-1263 දී පමණ සිදු වූ ජාවක චන්ද්‍රභානු ගේ දෙවන ලංකා ආක්‍රමණය ද මෙම පරිච්ඡේදයේ සඳහන් කර ඇත. (පූජාවලිය 2010 : 860) නමුත් එහි ප්‍රමාණාත්මක විස්තරයක් ඉදිරිපත් නොවේ. පූජාවලිය ක්‍රි.ව 1266 දී රචනා වූ බවට පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වන නිසා කෘතිය රචිත සමයට ආසන්නතම වසරවල සිදුවූ සිදුවීම් කෙරෙහි රචකයා එතරම් උනන්දුවක් නොදැක්වීම මෙම සිදුවීම ප්‍රමාණාත්මක ලෙස වාර්තා නොවීම සඳහා ප්‍රධාන සාධකයක් වූ බව අනුමාන කළ හැකිය. විශේෂයෙන් මේ අවස්ථාව වන විට දී පරාක්‍රමබාහු රජු ද වයස්ගතව රෝගී තත්ත්වයේ පසුවූ නිසා මෙම කෘතිය ඉක්මණින් සම්පාදනය කොට රජු වෙත පිළිගැන්වීමේ අවශ්‍යතාවයක් පැවති බව තවත් මතයකි. (පූජාවලිය 2010:864) මෙම පසුබිම තුළ කෘතිය රචනා කරන ලද කාලයට ආසන්නතම වසරවල සිදු වූ සිද්ධියක් මෙම කෘතිය සඳහා ඇතුලත් නොවීම එතරම් අවධානයට ලක් කළ යුතු කරුණක් ද නොවේ.

පූජාවලිය ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස ඇගයීමේ දී අංශ කිහිපයක් වෙත අපගේ අවධානය යොමු කෙරේ. එනම් පූජාවලිය අවසාන පරිච්ඡේදයේ අවසාන කොටස පසුව එකතු කරන ලද කොටසක් ලෙසින් ද සැලකේ. විශේෂයෙන්ම ඒ.වී. සුරවීර මේ පිළිබඳ මතයක් පළකර ඇත. (සුරවීර 1961: vi - vii) කෙසේ නමුත් මේ දක්වා විද්වතුන් ගේ වැඩි අවධානය යොමුවී ඇත්තේ පූජාවලිය දෙවැනි පරාක්‍රමබාහු රජුගේ අවසාන රාජ්‍ය වර්ෂයේ දී හෝ ඊට නොබෝ කාලයකින් පසුව හෝ රචනා කොට මෙම ග්‍රන්ථයට එකතු කරන ලද බවය. මයුරපාද හිමියන් ස්වකීය රාජකීය අනුග්‍රාහකගේ අභාවයෙන් පසුවත් ජීවත්ව සිටි බව උන් වහන්සේ විසින්ම රචිත යෝගාර්ණවය නම් වෛද්‍ය ග්‍රන්ථයෙන් පැහැදිලි වන නිසා මෙම එකතු කරන ලද කොටස මයුරපාද හිමියන් විසින්ම රචනා කරන ලදැයි යන්න තවදුරටත් තහවුරු වේ. (යෝගාර්ණවය 2008: 1-2)

පූජාවලිය ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් පරිච්ඡේද 33 හා 34 වැනි යන ඒවායේ වැදගත්කම විමසීමේ දී මෙය දිවයිනේ ඉතිහාසය ඉදිරිපත් කිරීමට සිංහල භාෂාවෙන් ගනු ලැබූ උත්සාහයේ දැනට ඉතිරි පැරණිතම කෘතිය ලෙසින් නම්දරා ඇත. මෙහි තුන්වැනි විජයබාහු රජු හා දෙවැනි පරාක්‍රමබාහු රජු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සිදුවීම්වල වැදගත්කම වනුයේ ඒවා සියැසින් දැක අදාල විස්තර ඉදිරිපත් කිරීමය. එසේම එහි දැක්වෙන කතා සාරය මහාවංශයේ ද විස්තරවීම නිසා එය වැදගත් කොට සැලකිය හැකිය. එසේම සමකාලීන ලේඛකයෙකු ඉදිරිපත් කරන තොරතුරු වශයෙන් මාඝ හා චන්ද්‍රභානු පිළිබඳ ඉදිරිපත් කරන කරුණු පූජාවලියේ විශේෂ වැදගත්කමක් උසුලයි. මහාවංශයේ සඳහන් නොවන ඇතැම් තොරතුරු පූජාවලියේ මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇත. එනම් චන්ද්‍රභානු පරාජයට පත් කිරීමෙන් අනතුරුව පරාක්‍රමබාහු රජුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර විජයබාහු කුමරු හා බෑණනුවන් වූ වීරබාහු කුමරු ජයග්‍රාහීව පොළොන්නරුවට පිවිසි රාජ්‍ය වර්ෂය (සවිසිවැනි හවුරුදු) යැයි නිශ්චිත වශයෙන් සඳහන්වීම නිසා ජාවක රජු පරාජයට පත් කිරීම සිදුවූ වර්ෂය පමණක් නොව දෙවැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ සිදුවූ පාණ්ඩ්‍ය ආක්‍රමණවල කාල නිර්ණයට ද මහඟු අත්වැලක් සපයනු ලැබේ. (පූජාවලිය 2010: 865, පරණවිතාන: 1972, 628) මාඝ විසින් රජරට පාලනය කළ කාලය පිළිබඳ පූජාවලිය ආධාරයෙන් ඔහු පරාජයට පත්වූ වර්ෂය පිළිබඳව ද යම් අදහසක් ඉදිරිපත් කිරීමට ද හැකි වේ. (පරණවිතාන 1972: 620-621) නමුත් දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමය විස්තර වන සියලුම වෙනත් මූලාශ්‍රයවල මෙන් පූජාවලිය ද පාණ්ඩ්‍ය ආක්‍රමණ පිළිබඳ නිශ්චිතව සඳහන් නොකෙරිණි. එසේම පූජාවලියේ පෙනෙන තවත් වැදගත් කරුණක් වනුයේ තුන්වැනි විජයබාහු රජු හා දෙවැනි පරාක්‍රමබාහු රජු සහ අන්‍ය දඹදෙණි පාලකයන් පිළිබඳ දැක්වෙන කරුණු හා මහාවංශයේ ඒ පිළිබඳ දැක්වෙන කරුණු අතර ඇති සමානාත්මතාවයයි. වෙනසකට ඇත්තේ මහාවංශයේ තොරතුරු දැක්වීම වඩාත් සවිස්තර ස්වරූපයක් ගැනීම පමණකි.

බොහෝ විට ග්‍රන්ථ දෙකෙහි ම වචනයක් පාසා සමාන ස්වරූපයක් ද දැක්වේ. (පූජාවලිය 2010:858, මහාවංශය, 2010: 1-21) මේ සඳහා ග්‍රන්ථ ද්වයෙහිම කර්තෘවරුන් පොදු මූලයකින් ආභාසය ලබන්නට ඇති බව විශ්වාස කළ හැකිය.

දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමය පිළිබඳ තොරතුරු ඇතුලත් අන්‍ය සමකාලීන කෘතීන් අතරින් හත්තවනගල්ල විහාරවංශය තවත් වැදගත් ග්‍රන්ථයකි. මෙය අනුරාධපුර රාජ්‍ය සමයේ පාලනය යෙදුණු සහෝදර පාලනයක් ගෙන ගිය සිරිසඟ බෝධි රජු සමය පිළිබඳ ඉදිරිපත් වන තොරතුරු ඇසුරින් රචනා වූ කෘතියකි. මෙහි කර්තෘගේ නාමය සඳහන් නොවන නමුත් කලි සබ්බයතිරාජ අනෝමදස්සි හිමියන්ගේ ආරාධනයෙන් ලියන ලද බව මුල් ගාථාවල දැක්වේ. (හත්තවනගල්ල විහාරවංසය 2008: 4-5) මෙම හිමියන් මහාවංශයේ විස්තර වන අනෝමදස්සි මහාසාමි යනුවෙන් සැලකිය හැකිය. එනම් දෙවැනි පරාක්‍රමබාහු රජු මෙම මහාසාමි හිමියන්ට දේවපතිරාජ අමාත්‍යවරයා ලවා අත්තනගල්ලේ තෙමහල් ප්‍රාසාදයක් කරවූ බව (මහවංශය 2010:37-39) වාර්තා වන බැවින් මෙම හිමියන් මෙම ස්ථානයේ වැඩ හිඳිමින් සිය ශිෂ්‍යයෙකු ලවා මෙම කෘතිය රචනා කරන්නට ඇතැයි විශ්වාස කළ හැකි බව විශ්වාස කෙරේ. (ලියනගමගේ 1989:27) ආචාර්ය ගොඩකුඹුර මෙහි සඳහන් මහාසාමිවරයා පිළිබඳ විස්තර කරමින් පවසා ඇත්තේ මහාවංශයේ දැක්වෙන අනෝමදස්සි මහාසාමි හා හත්තවනගල්ල විහාරවංශයේ දැක්වෙන් සබ්බයතිරාජ අනෝමදස්සි ස්ථවිරයන් දෙදෙනාම එක් අයෙකු බවය. *(Hattavanagallaviharavamsa* 1956: X) එසේම දඹදෙණි යුගයට අයත් දෛවඥකාමධේනු නම් සංස්කෘත භාෂාවෙන් ලියූ නක්ෂත්‍ර ග්‍රන්ථයේ කර්තෘවරයාත් සිදත් සඟරාව නම් සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයේ කර්තෘත්වයත් යන සියල්ල මේ හිමියන්ට අයත් බවය. *(Hattavanagallaviharavamsa* 1956: X)

හත්තවනගල්ල විහාරවංශය පූජාවලියට යම් කාලයකට ප්‍රථමයෙන් රචනා වී ඇති බව ගොඩකුඹුර ගේ අදහස වේ. එනම්

හත්තවනගල්ල විහාරවංශයේ දෙවැනි පරාක්‍රමබාහු රජු පිළිබඳව එන විස්තරයේ චන්ද්‍රභානුගේ ආක්‍රමණය පිළිබඳ සඳහන් වී ඇත. චන්ද්‍රභානුගේ ආක්‍රමණය පළමු වරට සිදුවූයේ ක්‍රි.ව 1247 දී හෝ ඊට ආසන්නතම කාලයක බව සාමාන්‍යයෙන් පිළිගැනේ. මෙම කෘතිය චන්ද්‍රභානු ගේ ආක්‍රමණ දෙක වෙන්කොට දක්වා නැති නමුත් එම සටනේ දී චන්ද්‍රභානු මරණයට පත්වූ බව විස්තර වන ආකාරය පිළිඹිබු වන නිසා මෙහි කර්තෘවරයා චන්ද්‍රභානු ගේ දෙවැනි ආක්‍රමණය විස්තර කර ඇති බව ඉන් පැහැදිලි වේ. මෙම දෙවැනි ආක්‍රමණය ක්‍රි.ව 1261-1262 ආසන්න කාලයක දී සිදුවූ බව බොහෝ දුරට පිළිගැනේ. එනිසා මෙම කෘතිය ද ඊට ආසන්න කාලයකදී හෝ ඊට ආසන්නතම පසු කාලයක දී හෝ රචනා වන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. එබැවින් පූජාවලිය උක්ත සඳහන් කළ පරිදි ක්‍රි.ව 1266 ට අයත් බව විශ්වාස කරන නිසා මෙම හත්තවනගල්ල විහාරවංශය ඊට වඩා පැරණි කෘතියක් ලෙසින් සැලකිය හැකි වේ. එසේම පූජාවලිය විස්තරයට වඩා මෙම කෘතියේ ගෙන එන තොරතුරු වඩා සංක්ෂිප්ත වුවත් මෙහි වඩා සැලකිය යුතු වටිනාකමක් යුක්ත ය. එනම් එකොළොස්වැනි පරිච්ජේදයේ මුල් ජේදවල තුන්වැනි විජයබාහු රාජ්‍ය ප්‍රාප්තියට පත්වීමට පෙර එනම් මාඝගේ ආක්‍රමණය සිදු වූ අවධියේ ලංකාවේ පැවති දේශපාලන තත්ත්වය පිළිබඳව විස්තරයක් ඉදිරිපත් කර ඇත. (හත්ථවනගල්ල විහාරවංසය 2008: 30) එසේම වෙනත් කිසිදු මූලාශ්‍රයක නොදැක්වෙන තුන්වැනි විජයබාහු රජුගේ පියාගේ නම විජයමල්ල බව මෙහි සඳහන් වේ. (හත්ථවනගල්ල විහාරවංසය 2008:30-31)

මේ රජ සමයේ මෙරටට එල්ල වූ චන්ද්‍රභානු නම් ජාවක රජුගේ රට තාම්බ්‍රලිංග හෙවත් සම්බලිංගවිෂය යනුවෙන් මෙහි සඳහන් වේ. ජෛයියා ලිපියෙන් අනාවරණය වූ පරිදි මලයා අර්ධද්වීපයේ පිහිටි පැරණි තාම්බ්‍රලිංග රාජ්‍යයේ අධිපති වූ තාම්බ්‍රලිංගේශ්වර චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කළ බව මහාචාර්ය පරණවිතානගේ අවධානයට ලක් වූ දේශීය මූලාශ්‍රයකින් එන යථෝක්ත පාඨයෙන් සනාථ වේ. (හත්ථවනගල්ල විහාරවංසය

2008:31-32,. පරණවිතාන 1972: 623) එනිසා මෙම මූලාශ්‍රයේ දැක්වෙන තොරතුරු චන්ද්‍රභානුගේ ලංකා ආක්‍රමණය පිළිබඳ වඩාත් ගැඹුරු අධ්‍යයනයකට ප්‍රවේශවීම සඳහා බෙහෙවින් උපකාරී වේ. ලංකාව විදේශ ආක්‍රමණ කිහිපයකට ගොදුරු වූ අවධියක් උක්ත ග්‍රන්ථය රචනා කළ සමයේ දී යෙදුණු බව මෙම කෘතියෙන් විද්‍යාමාන වේ.

මෙම පාලි කෘතිය ජනප්‍රියවීමත් සමග දාහතරවැනි හා පහළොස්වැනි සියවස් සමයේ දී මෙය දෙවරක් සිංහලයට නගනු ලැබිණි. එනම් ගම්පොළ පස්වැනි බුවනෙකබාහු රජු සමයේ (ක්‍රි.ව 1372-1408) ශක වර්ෂ 1324 එනම් ක්‍රි.ව 1402 දී ය. එහි අනුවාදකගේ නාමය නැතත් ශත්‍රුසිංහ කුඤ්ජර නම් ඇමති ගේ ආරාධනයෙන් කරන ලද බව විස්තර වේ. (එළුඅත්තනගලු වංසය 1923 :01) දෙවැනි සිංහල අනුවාදය හයවැනි පරාක්‍රමබාහු රාජ්‍ය ආරාධනයෙන් වීදාගම මෛත්‍රී ස්ථවිරයන් ගේ ශිෂ්‍යයෙකු කරන ලද බව විශ්වාස කෙරේ. (එළුඅත්තනගලු වංසය 1954: II) මෙම සිංහල අනුවාදනය පාලි ග්‍රන්ථයේ පදානුගත පරිවර්තනයක් නොවන නමුත් සාමාන්‍යයෙන් මුල් කෘතිය ඇසුරු කර ගනිමින් සම්පාදනය කරන ලද බව සැලකේ. එනිසා යම් පමණ සුළු සුළු වෙනස්කම් මෙම කෘතීන් අතර දක්නට ලැබේ.

දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයට අයත් තවත් වැදගත් කෘතියක් වනුයේ දඹදෙණි කතිකාවතයි. මෙකල පැවති බෞද්ධ භික්ෂු විනය පිරිහෑම වැළැක්වීම සඳහා දෙවැනි පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහයෙන් පවත්වන ලද සංඝ සම්මේලනය අවසානයේ දී නිකුත් කරන ලද විනය නීති මාලාව යථෝක්ත ලේඛනයෙහි දැක්වේ. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක විසින් ස්වකීය කතිකාවත් සඟරා නම් කෘතියෙහි අන්‍ය කතිකාවත් ද සමග මෙම දඹදෙණි කතිකාවත පළකර ඇත. (ජයතිලක ඩී.බී. 1955:6-20) තුන්වැනි විජයබාහු රාජ්‍ය සමයේ වනවාසී හා ග්‍රාමවාසී නිකායන්ට අධිපතිව සිටි සංඝරක්ඛිත හා මේධාලංකාර යන ස්ථවිරයන්ගේ ප්‍රධානත්වයෙන් මෙකී සංඝ සම්මේලනය පැවැත්වීම පිළිබඳ මෙහි තොරතුරු

ඇතුලත් වේ. මෙහි තුන්වැනි විජයබාහු සහ දෙවැනි පරාක්‍රමබාහු යන රජවරුන් දෙදෙනා විසින් විදේශීය ආක්‍රමණිකයන් පරාජයට පත්කිරීමත් රජරට දමිළ ආක්‍රමණිකයන්ට ගොදුරු වූ කල්හි ඉන් පීඩාවට පත් මහා සංඝයා ආරක්ෂාව පතා දකුණු ඉන්දියානු රාජ්‍ය හා මායා රටට පලාගිය ආකාරය පිළිබඳවත් වාර්තා කර ඇත.

පාලි දාඨාවංශය ඇසුරින් හතරවැනි පරාක්‍රමබාහු රජ සමයේ දෙව්රද දම්පසඟිනාවන් නැමැත්තෙකු විසින් ශක වර්ෂ 1240 (ක්‍රි.ව 1318) දී රචනා කළ දළදා සිරිත නම් සිංහල කෘතිය ද වැදගත් වේ. (දළදා සිරිත 1954:03) ලංකාවට දන්ත ධාතුව වැඩම කිරීමේ පුවත පාලි කාව්‍යයේ දැක්වෙන ආකාරයටම මෙහි දී ද විස්තර වී ඇත. හතරවැනි පරාක්‍රමබාහු දක්වා ලංකා ඉතිහාසයේ දළ සටහනක් හා සිංහල රජවරු දන්ත ධාතුව සඳහා සිදුකරන ලද පූජෝපහාර පිළිබඳ විස්තරයක් ද මෙහි දැක්වෙන අතරම දළදාව සඳහා සිදුකළ යුතු වත් පිළිවෙත් පිළිබඳව ද සැලකිය යුතු සඳහනක් මෙහි අන්තර්ගත වේ. තුන්වැනි විජයබාහු හා දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයන් පිළිබඳව ප්‍රධාන සිදුවීම් සඳහන් වෙතත් ඒවා පිළිබඳව පූජාවලියෙන් අනාවරණය වන තොරතුරුවලට වැඩි යමක් දළදා සිරිතෙන් හමු නොවේ. දෙවැනි පරාක්‍රමාබහු රාජ්‍ය සමයේ සිදු වූ චන්ද්‍රභානු ආක්‍රමණ පිළිබඳ මෙහි තොරතුරු ඇතුලත් නොවන නමුත් ධර්මකීර්ති හිමියන් තම්බලිංගමුවේ සිට ලංකාවට පැමිණි බව මෙහි විශේෂයෙන් සඳහන් වන කරුණකි. (දළදා සිරිත 1954:42-48) දඹදෙණි අස්න නැමති සිංහල කෘතිය ප්‍රස්තුත මූලාශ්‍රයන් සමාලෝචනයේ දී තවත් වැදගත් කෘතියකි. (දඹදෙණි අස්න හා කඳවුරු සිරිත 1998:09-35)

දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ලංකාවට එල්ල වූ විදේශීය ආක්‍රමණ පිළිබඳ මෙහි තොරතුරු ඇතුලත් වේ. එහෙත් එම ආක්‍රමණ විස්තර කර ඇත්තේ බෙහෙවින් අතිශයෝක්ත ස්වරයකිනි. එහිදී විශේෂයෙන් විදේශීය ආක්‍රමණ සඳහා මුහුණ දීමට ඉතා සංවිධානාත්මක ආරක්ෂක ක්‍රමවේද අනුගමනය කළ

ආකාරය මෙහි දැක්වෙන යුධ හමුදා නිලධාරි නාමලේඛනය, විවිධාකාර යුධෝපකරණ හා යුද්ධායුධ පිළිබඳ විස්තරය ආදිය පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වේ. එසේම සමස්තයක් ලෙස ගත්කළ මෙම කෘතියේ ද්‍රවිඩ ආභාසය මෙකී තොරතුරු ඇසුරින් දක්නට ලැබීම ද විශේෂත්වයකි. (දඹදෙණි අස්න හා කඳවුරු සිරිත 1998:02-03)

දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමය පිළිබඳ ප්‍රයෝජනවත් වන තත් කාලීන ග්‍රන්ථයක් ලෙස කඳවුරු සිරිත නම් ලේඛනය සැලකිය හැකිය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති අත්පිටපතක් ආශ්‍රයෙන් එය සංස්කරණය කරමින් ශ්‍රීමත් ඩී.බී. ජයතිලක ස්වකීය සිංහල සාහිත්‍ය ලිපි නැමති සංග්‍රහයේ මෙය පළ කරන්නට යෙදුණි. (ජයතිලක ඩී.බී. 1956:63-66, දඹදෙණි අස්න හා කඳවුරු සිරිත 1998:36-46) මෙහි කලිකාල සාහිත්‍ය සංගීත සර්වඥ පණ්ඩිත හෙවත් දෙවැනි පරාක්‍රමබාහු රජුගේ දින චර්යාව ගෙනහැර දක්වා ඇත. මනු නීතියේ දැක්වෙන චාරිත්‍රවලට අනුගතව රජුගේ දින චර්යාව හැඩගැසී ඇති අයුරු මෙහි දැක්වෙන අතර මධ්‍යකාලීන ලංකාවේ පැවති පරිපාලන තන්ත්‍රය හා එහි ස්වභාවය අවබෝධ කර ගැනීමට මෙම කෘතිය ප්‍රයෝජනවත් වන බව සඳහන් කළ යුතුය.

දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයට සෘජුවම අයත් වන අලුත්නුවර දේවාලය කරවීම යන ලේඛනය ද වැදගත් වේ. එය ශ්‍රීමත් ඩී.බී. ජයතිලක විසින් සිය සිංහල සාහිත්‍ය ලිපි කෘතියේ පළ කරන්නට යෙදුණි. (ජයතිලක ඩී.බී 1956:67-68) මෙහි දෙවැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍යත්වයට පත්වූ වර්ෂය බු.ව 1779 බව සඳහන් කර තිබීම රජුගේ රාජ්‍ය සමයේ සිදු වූ සිදුවීම් නිශ්චය කර ගැනීමේදී වැදගත් වේ. එහි දී දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය අවධියට අයත් දෙවුන්දර සෙල්ලිපියේ දැක්වෙන වර්ෂ හා මෙම ලේඛනයේ දැක්වෙන වර්ෂ අතර සාම්‍යයක් දක්නට ලැබීම එහි නිශ්චිත බව තවදුරටත් තහවුරු කිරීමකි. එසේ ම මෙම ලේඛනයේ දැක්වෙන තවත් විශේෂ තොරතුරක් වනුයේ රජුගේ විසිදෙවැනි

රාජ්‍ය වර්ෂයේ දී කතාව ගොත වීමේ රෝගයකට රජු මුහුණදුන් බවකි. (ජයතිලක ඩී.බී 1956:67) මෙම සුවකළ නොහැකි රෝගය නිසා රජුගේ පුතුන් රාජ්‍ය අනුප්‍රාප්තිකයින් බවට පත්වීමේ පසුබිම හා ඒ වනවිට සිදුවූ පාණ්ඩ්‍ය හා චන්ද්‍රභානු ආක්‍රමණවල ස්වරූපය හා එහි වර්ෂ නිර්ණය කර ගැනීමට ද හැකියාව ලැබී ඇත.

සමාරම්භයේ සිට කතුවරයාගේ කාලය දක්වා බුදු සමයේ ඉතිහාස ගෙන හැර දක්වන නිකාය සංග්‍රහය ගම්පොළ පස්වැනි බුවනෙකබාහු රාජ්‍ය සමයේ ජයබාහු දේවරක්ෂිත හිමියන් විසින් රචනා කළ කෘතියකි. (නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය 1980:01) මෙහි සඳහන් අවසාන සංඝ සංශෝධනය බු.ව. 1941 (ක්‍රි.ව 1398) දී සිදුකර ඇත. දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ සංඝ සංශෝධනය මෙයට ඇතුලත් වන අතර මාඝගේ පාලන සමයේ සංඝයාට අත්විඳීමට සිදු වූ අපහසුතා ද දැක්වෙන අතර විදේශීය රාජ්‍ය හා ඒවායේ භික්ෂූන් අතර පැවති සම්බන්ධතාවය පිළිබඳ යම් අදහසක් මෙහි විස්තර වී ඇත.

සද්ධර්මරත්නාකරය දෙවැනි ධර්මකීර්ති හිමියන්ගේ ශිෂ්‍යයෙකු වූ විමලකීර්ති හිමියන් විසින් හයවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ (ක්‍රි.ව. 1412-1467) රචනා කරන ලද්දකි. (සද්ධර්මරත්නාකරය 1955:02) ධර්මයේ විවිධ වූ කරුණු විවරණය කිරීමට වෙන් වූ පරිච්ඡේද තිස් හයකින් යුත් විශාල ප්‍රකරණයකි. නිකාය සංග්‍රහයේ දැක්වෙන ශාසනික ඉතිහාසය පිළිබඳ විස්තර මෙහි ආශ්‍රය කර ගෙන ඇති ආකාරයක් දක්නට ලැබෙන අතර දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ සිට හයවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමය දක්වා දේශපාලන ඉතිහාසය විග්‍රහ කිරීමේ දී ගම්පොළ රාජ්‍ය සමයේ ප්‍රබලත්වයට පත්වූ අලගක්කෝණාර අමාත්‍යවරයා හා අලකේශ්වර පරම්පරාව පිළිබඳ විස්තරයක් ද ඉදිරිපත් කර තිබේ. ඒ අනුව මේ අවධියේ දකුණු ඉන්දියානු රාජ්‍ය සමඟ ලංකාව පැවති අත්‍යන්ත සම්බන්ධතා පිළිබඳ විවරණය කිරීමට ද මෙකී ග්‍රන්ථය උපකාරී වේ.

එසේම ගිහි විනය අළලා රචිත පාලි ග්‍රන්ථයක් වන උපාසකජනාලංකාරය ලංකාව හා දමිළයන් ගේ ආක්‍රමණවලට ගොදුරුවීමෙන් පසුව දිවයිනේ පැවති තත්ත්වය පිළිබඳව සඳහන් කරයි. (උපාසකජනාලංකාර 1914:11) මෙය මාඝ ගේ ආක්‍රමණ පිළිබඳ විස්තර කිරීමට ඉදිරිපත් වූ සඳහනක් ලෙසින් සැලකිය හැකියි. මෙම කෘතියේ කර්තෘ වූ භදන්ත ආනන්ද ස්වකීය ග්‍රන්ථ නිගමනයෙහි සඳහන් කරන පරිදි ලංකාව ආක්‍රමණය කළ දමිළයන් දිවයින විනාශ කළ කල්හි බොහෝ මහතෙරවරුන් චෝළ පාණ්ඩ්‍ය රාජධානිවලට නික්ම ගොස් ඇත්තාහ. තමා ද ඔවුන් අතරින් කෙනෙකු බව විස්තර කර තිබේ. පාණ්ඩ්‍ය දේශයේ වඤ්ඤෝ සාමන්ත යනුවෙන් හඳුන්වන සාමන්ත පාලකයෙකු විසින් තනා දුන් විහාරයක සිට මෙම කෘතිය ලියූ බව ද එහි වැඩිදුරටත් විස්තර වේ.

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය


උපාසකජනාලංකාර, 1914, සංස්. ධම්මක්ඛන්ද හිමි, වැලිගම

එළු අත්තනගලු වංසය., 2008, සංස්. වී.ඩී.එස්. ගුණවර්ධන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

පූජාවලිය.,1, 2010, සංස්. වේරගොඩ අමරමෝලි ස්ථවිර, රත්න පොත් ප්‍රකාශකායෝ, මරදාන

පූජාවලිය.,2, 1930, සංස්. බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය හිමි, පානදුර

මහාවංශය., 1966, දෙවැනි කොටස, අනුවාදක. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, කොළඹ

නිකාය සංග්‍රහ හෙවත් ශාසනාවතාරය., 1989, සංසඃ ආචාර්ය බන්දුසේන ගුණසේකර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

දළදා සිරිත,. 1946, සංස්. වැලිවිටියේ සෝරත හිමි, කොළඹ

දළදා සිරිත, 1954, සංස්. වැලිවිටියේ සෝරත හිමි, කොළඹ

දඹදෙණි අස්න හා කඳවුරු සිරිත., 1998, සංස්. හබරකඩ වජිර හිමි,තරංජි ප්‍රින්ටර්ස්, නාවින්න

යෝගාර්ණවය., 2008 සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10